# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.22 පැය 1320 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 117 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**01. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගිරාන්දුරුකෝට්ටේ පොලිස් වසම.**

2025.01.21 වන දින උදෑසන කාලයේ ගිරාන්දුරුකෝට්ටේ පොලිස් වසමේ කිරිමැටියාව ප්‍රදේශයේදී ගිරාන්දුරුකෝට්ටේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වූ දඹුලුහල්මිල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගිරාන්දුරුකෝට්ටේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය**

2025.01.22 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ මුවදොර උයන මහල් නිවාස ප්‍රදේශයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වූ කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. වන අලියෙකු පහර දීමෙන් කාන්තාවක් මියයාම අත්අඩංගුවට - අරලංගවිල පොලිස් ස්ථානය.**

2025.01.221 වන දින උදෑසන කාලයේ අරලගංවිල පොලිස් වසමේ කැකුළුවෙල, අරලගංවිල ප්‍රදේශයේදී වන අලියෙකු පහරදීමෙන් කාන්තාවක් මියගොස් ඇති බවට අරලගංවිල පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 41 ක් වූ කැකුළුවෙල ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

මෘතශරිරය අරලගංවිල රෝහලේ මෘතශරීරාගාරයේ තැන්පත් කර ඇත. අරලංවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**